**ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට  වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත්  මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ  ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට.

(ආ) මෙම වාර්තාවේ 1.6.3 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ පොත් අනුව වෙනත් ලැබීම් රු.41,611,755 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.41,498,755 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු.72,623,444 ක් වූ අතර, අමාත්‍යාංශ පොත් අනුව එම අගය රු.72,468,359 ක් වූයෙන් වෙනස අක්මුදල් ගැලපුම් ගිණුමේ ගලපා නොතිබුණි. | අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල වෙනස්කම්වලට හේතු සොයා බලා අක්මුදල් ගැලපුම් ගිණුමේ ගැලපිය යුතුය. | 2020 පෙබරවාරි ගිණුම් සාරාංශය මඟින් නිවැරදි කර ඇති බව. |
| (ආ) මැතිවරණ කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කලයුතු රු.548,508 ක් වූ ශේෂය හා ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොදැක්වෙන 2019 දෙසැම්බර් 31 දිනට රු.2,014,743 ක් වූ අග්‍රිම ශේෂය පිළිවෙලින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස හා ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ශීර්ෂ යටතේ ගනුදෙනු සටහන් කළ යුතුය. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේ දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කිරීමට කටයුතු කරමි. |

**1.6.3** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මුදලින් දරන ලද පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වල එකතුව රු.851,017,115 ක් වූවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.870,265,396 ක් ලෙස දක්වා තිබුණි. | සියලු මුදල් ප්‍රවාහයන් නිවැරදිව පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. | නිවැරදි ආකෘතියට මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. |
| (ආ) | සහනාධාර හා මාරු කිරීම් වටිනාකම රු.82,900 කින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල අඩුවෙන් දක්වා තිබුණි. | සියලු මුදල් ප්‍රවාහයන් නිවැරදිව පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. | නිවැරදි ආකෘතියට මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. |
| (ඇ) | ඒසිඒ-5 ආකෘතිය අනුව අත්තිකාරම් මුදලින් ලැබීම් හා ගෙවීම් වටිනාකම් පිළිවෙලින් රු.24,323,842 ක් හා රු.33,196,349 ක් වූ අතර, එම වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. | සියලු මුදල් ප්‍රවාහයන් නිවැරදිව පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. | නිවැරදි ආකෘතියට මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. |
| (ඈ) | භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත් කර ගැනීම් වටිනාකම රු.46,799 කින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල අඩුවෙන් දක්වා තිබුණි. | සියලු මුදල් ප්‍රවාහයන් නිවැරදිව පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. | නිවැරදි ආකෘතියට මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේ දී ඒ සම්බන්ධව කටයුතු කරනු ලබන බව. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම**<br>රු. | **අනුකූල නොවීම** | | |
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල්රෙගුලාසි 103 (1) (ඊ) | 13,902,198 | 2015 හා 2017 වර්ෂවල අවස්ථාවන් 3 කදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානි අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අලාභ අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(ආ)** | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය<br>(i) 2.2.4 හා 2.2.5 ඡේද | - | ව්‍යාපෘති අධ්‍යක්ෂ හා අනෙකුත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීම් මඟින් ප්‍රමාණවත් කාලයක් තුල කැඳවීම් කර විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම් සිදු කිරීම කල යුතු වුවත් එම ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අමාත්‍යතුමියගේ ලිඛිත නියෝග පරිදි අනුමත තනතුරු සඳහා පමණක් පත්වීම් ලබා දෙන ලද බව. |
| | (ii) 2.2.8 ඡේදය | 1,216,245 | ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් වයස අවු.65 ඉක්ම වූ කිසිවෙකු සේවයේ නොයෙදවීමට අමාත්‍යාංශ ලේකම් තහවුරු කර ගත යුතු වුවද, වයස අවු.65 ඉක්ම වූ නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන ඒ සඳහා වැටුප් හා වේතන ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අමාත්‍යතුමියගේ ලිඛිත නියෝග පරිදි අනුමත තනතුරු සඳහා පමණක් පත්වීම් ලබා දෙන ලද බව. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | 2016 අංක 12 - දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 9(1)(අ) වගන්තිය | ව්‍යාපෘතියකට මුල පිරීම සම්බන්ධයෙන් මහජනයා දැනුම් දීමේදී අමාත්‍යවරුන්ට ඇති කාර්යභාරය ඉටු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | විගණන විමසුම නිවැරදි බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.2,850,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | වියදම් උද්ගත නොවීම, කාර්යාල උපකරණ අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව භාවිතා කිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. |
| **(ආ)** | පුනරාවර්තන වැය විෂයයන් 8 ක් සඳහා සලසා තිබුණ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 73 දක්වා පරාසයක ඉතිරිවීම් විය. | - එම - | යන්ත්‍ර අවශ්‍යතා ඇති නොවීම, කාර්යක්ෂමව භාවිතය 2019 වර්ෂයේ පැවති දේශපාලන අස්ථාවර භාවය මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වීමට හේතු වී ඇති බව. |
| **(ඇ)** | ප්‍රාග්ධන වියදම් වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 83 දක්වා පරාසයක ඉතිරිවීම් දක්නට තිබුණි. | - එම - | අමාත්‍ය කාර්යාලයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් පුනරුත්තාපන අවශ්‍යතා ඇති නොවීම, වාහන, යන්ත්‍ර හා කාර්යාල උපකරණ කාර්යක්ෂමව භාවිතා කිරීම මෙම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇති බව. |

**2.2. තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල රු.20,000,000 ක තැන්පතු ශේෂයක් පවතින අතර, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට පවතින තැන්පතු ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2018 ජූලි 11 වන දින ලිපියක් යොමු කර ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාල අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි. | දැක්ම හා මෙහෙවරට අනුකූලව කටයුතු කළ යුතුය. | රාජ්‍ය යාන්ත්‍රණයේ කාන්තා හා ළමුන්ගේ සුභසාධනය උදෙසා කටයුතු කරන ප්‍රධාන පාර්ශවකරුවන් වන මෙම අමාත්‍යාංශය ජාතික වශයෙන් වැදගත් වන ප්‍රතිපත්තීන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිරතුරුවම කටයුතු කරනු ලබන බව. |

**3.2 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අදාල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී නිවැරදිව පිළියෙල කරනු ලබන බව. |

**3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වියළි කලාප සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත රු.331,000,000 ක මුදලින්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,372,000 ක් එනම්, සියයට 20 ක් පමණක් වියදම් කර තිබුණි. 2019 දෙසැම්බර් 19 දින මෙම ව්‍යාපෘතිය මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයට භාරදුන් අතර, එම දිනට ජලපවිත්‍රාගාර ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 10 ක් ද, කෘෂිමාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 5 ක ප්‍රගතිය සියයට 5 සිට සියයට 20 ක් අතර විය. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ළඟා කර ගත යුතුය. | 2019 වර්ෂයේ වියළි කලාප සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන පරිපාටිවලට අනුකූල නොවන තත්ත්වයන් උදා වූ විට ඒවා නිවැරදි කිරීමට අපේක්ෂා නොකල කාලයක් වැය කිරීමට සිදු වූ නිසා ඉලක්ක ගත පරිදි ඉහළ ප්‍රගතියක් අත් කර ගැනීමට නොහැකි වූ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1938 කාන්තා උපකරණ දුරකතන සේවාව ශක්තිමත් කිරීම, එම සේවාව ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා සහායක සේවා ශක්තිමත් කිරීම, මහජනතාව දැනුවත් කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා රු.4,250,000 ප්‍රතිපාදන සලසා ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.1,572,873 ක් වියදම් කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය යන කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණු අතර, සම්බන්ධිත පාර්ශවයන්ගේ රැස්වීම් 3 ක් ද, පවුල් උපදේශන දැනුවත් කිරීම්, පොලිස් නිලධාරින් පුහුණු කිරීම්, සිද්ධි කළමනාකරණ පුහුණු කිරීම් වැනි වැඩසටහන් 4 ක් ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, සම්බන්ධිත පාර්ශවයන් සමඟ රැස්වීම් 1 ක් හා වැඩසටහන් 2 ක් පමණක් පවත්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කල කාර්යයන් ඉටු කල යුතුය. | නව තාක්ෂණික ක්‍රමවේදයක් මිලදී ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුළ අනුමත කර තිබුණ ද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් එය මිලදී ගැනීම ප්‍රමාද විය. නිලධාරීන් පුහුණු කිරීමේ එක් වැඩසටහනක් පවත්වා ඔවුන් තුළින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා හා ළමා ඒකකවල නිලධාරි පුහුණු කිරීමට කටයුතු සංවිධානය කරන ලදී. 2020 ජනාධිපතිවරණයේ තැපැල් ඡන්ද හා ඡන්ද රාජකාරී සඳහා පුහුණුවට නියමිත නිලධාරීන් යොමු වීම හේතුවෙන් වැඩසටහන සංවිධානය කළ දිනට පැවැත්වීමට නොහැකි විය. |
| (ඇ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ 2019 සැප්තැම්බර් 11 වන දින එළඹි ගිවිසුම ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 ඔක්තෝබර් 29 දින රු.1,850,000 ක චෙක්පතක් ලැබී තිබුණි. මෙම වැඩසටහනට අදාල වැය විෂයයට අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන නොතිබීම හේතුවෙන් එම චෙක්පත භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි. මුදල් වියදම් කිරීමේ බලය 2019 දෙසැම්බර් 24 දින ලැබී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමට අපොහොසත් වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් ඉටු කිරීම සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය. | 2019 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොතිබූ බැවින් 2019 නොවැම්බර් 11 දින අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටින ලදී. ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන ලැබුණේ 2019 දෙසැම්බර් 19 දින ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පෙර පාසල් වියේ දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීමෙ සහ දිළිඳු පවුල්වලට සුළු වශයෙන් ආර්ථීක වාසියක් සලසා දීම යන අරමුණු ළඟා කර ගැනීම සඳහා ආරම්භ කරන ලද උදෑසන ආහාර වේල ලබා දීමේ වැඩසටහන ජනවාරි ආරම්භ කර දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 217 කට රු.400,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අඩු බර සහිත දරුවන් සිටින පෙර පාසල් තවදුරටත් තිබෙන බව ද දන්වා එවා තිබුණු අතර, වර්ෂය අවසාන වන විට මෙම වැය විෂයයේ රු.68,172,480 ක් වූ ඉතිරි ප්‍රතිපාදන ලබා දීමට ක්‍රියාකාර නොතිබුණි. තවද, අඩු බර සහිත දරුවන් වැඩි වශයෙන් සිටින ප්‍රදේශවල සියලුම පෙර පාසල් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවන නිසා එම පෙර පාසල්වල දරුවන් වැඩසටහන ක්‍රියාත්මක වන පෙර පාසල් සඳහා යාමේ ප්‍රවණතාවයක් සමඟ ගැටළුකාරී තත්ත්වයක් ද නිර්මාණය වී තිබුණි. | සැලසුම් කල අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතුය. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් නිර්දේශය ලබා ගැනීමට යම් කාලසීමාවක් ගත වීම, අක්මුදල් භාණ්ඩාගාරයෙන් ලැබීම ප්‍රමාද වීම. |

**3.4** **ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | -------------------------------- |
| (අ) | මුල් ළමාවිය ඉගෙනුම් කව පිළිබඳ වීඩියෝ පටයක් නිර්මාණය කිරීම, ලෝක ළමා දින සඟරා, ආරාධනා පත්‍ර හා පරිවර්තන සේවා ලබා ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii), 2.8.1 (ආ), 3.4.2 (අ), 5.4.10, 6.2.2, 6.3.6, 7.11.1, 8.12.3(අ) ඡේදයන්ට පටහැනිව රු.1,633,200 ක් වැය කර තිබුණි. | වාර්ෂිකව පවත්වනු ලබන ලෝක ළමා දින උත්සවය සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදනයන් මනා සැලසුම් කිරීමකින් යුතුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව සිදු කළ යුතුය. | ලෝක ළමා දින උත්සවය සඳහා අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට සති කිහිපයක සීමාසහිත කාලසීමාවක් පමණක් පැවතුණි. එබැවින් ඒ සඳහා අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන මඟින් මිල ගණන් කැඳවා ඉදිරිපත් වන අඩුම මිල ගණන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර අදාල සේවාවන් ලබා ගැනීමට සැලසුම් කරන ලදී. |
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු වීඩියෝ කැමරාවක් මිලදී ගැනීම සඳහා දිරිය කාන්තා වැය විෂයය යටතේ රු.1,568,715 ක් වැය කර තිබූ අතර, එම වැය විෂයයේ අරමුණුවලට පටහැනිව සිදු කරන ලද ප්‍රසම්පාදනයක් බව ද නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන සැලසුමට අනුකූලව අදාල වැය විෂයයන් ගේ අරමුණුවලට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කල යුතුය. | අතපසු වීමක් නිසා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි වීම, කඩිනමින් වීඩියෝ කැමරාව ඇතුළු උපාංග ලබා දෙන මෙන් ඉල්ලීම් කර තිබීම, ජාත්‍යන්තර කාන්තා දින උත්සවයේ මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම සඳහා වීඩියෝ කැමරාවක් හා ඊට අදාල උපකරණ ලබා ගැනීම කඩිනමින් කර ගැනීමට සිදු වීම. |

**3.5** **අනාර්ථික ගණුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලෝක ළමා දින ජාතික උත්සවය සැමරීම සඳහා ළමා ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත එකතුව රු.6,580,000 ක් වෙන් කර තිබුණු අතර, ඉන් ළමුන්ට ත්‍යාග, ප්‍රවාහන වියදම්, ආහාර පාන සඳහා සහ ප්‍රාදේශීය වශයෙන් වැඩ සටහන් පැවැත්වීම වෙනුවෙන් රු.4,052,700 ක් පමණක් වැය කර තිබුණි. ජාතික උත්සවයේ වේදිකා, සැරසිලි, ආරාධනා පත්‍ර සමරු කලාප ආදී කාර්යයන් සඳහා රු.2,502,165 ක් වැය කර තිබුණි. දරුවන් මුහුණදෙන බරපතල සමාජ හා ආර්ථික ගැටළු විසඳීම සඳහා මෙම මුදල් යෙදවීම කෙරෙහි අවධානය යොමු විය යුතුව තිබුණි. | අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. | පිළිතුරු ලැබී නැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ දිරිය කාන්තා වැය විෂයය යටතේ ජාත්‍යන්තර කාන්තා දිනය හා ළමා දින සැමරුම් සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 10 ක ඇතුළුව ජාත්‍යන්තර කාන්තා දින සැමරුම සඳහා පමණක් රු.මිලියන 19.41 ක් ආහාරපාන, නවාතැන්, ප්‍රවාහන පහසුකම් හා ඉන්ධන, ප්‍රචාරන, වේදිකා යනාදී වියදම් සඳහා වැය කර තිබුණි. කාන්තාවන් මුහුණපාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර ක්‍රමෝපායන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මුදල් වැය කල හැකිව තිබුණි. | - එම - | ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා එම උත්සවයට සමගාමීව අනෙකුත් අංශ මඟින් ඒ ඒ වැය විෂයයන් මඟින් වාර්ෂිකව වැඩසටහන් රාශියක් සංවිධානය කරනු ලබන අතර, එම වැඩසටහන් සඳහා දරන ලද වියදම් ද මෙම වියදමෙහි ඇතුලත්ව ඇති බැවින් මුළු වියදම රු.මිලියන 19.412 ක් ලෙස වාර්තා වී ඇති බව. |

**3.6 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | **---------------------** | **----------** | **---------------------** |
| **(අ)** | 2015 වර්ෂයේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය ඇමතිතුමියගේ කාර්යයන් සඳහා ලබා දී තිබූ මෝටර් රථයක් 2015 වර්ෂයේදී වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ රියදුරෙකු ධාවනය කිරීමේ දී අනතුරට භාජනය වී තිබුණි. මේ පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී නොතිබුණු බව විමර්ශන වාර්තාවෙන් තහවුරු වී තිබුණි. | රජය සතු වත්කම් නිසි අධිකාරී බලයකින් යුතුව භාවිතා කළ යුතුය. | අදාල නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. |
| **(ආ)** | අමාත්‍යාංශය සතු වාහන 17 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි. | පැවරීමේ කටයුතු සිදු කළ යුතුය. | පැවරීමේ කටයුතු ඉතා කඩිනමින් සිදු කරනු ලබන බව. |

**(ඇ) පවරා නොගත් වත්කම් ලෙස පරිහරණය කිරීම**

**-------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **(i)** | අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක රු.මිලියන 25 ක් වැය කර 2001 වර්ෂයේ දී බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබූ අතර, 2020 අගෝස්තු 27 විගණන දින වන විටත් ඉඩම පවරා ගෙන නොතිබුණි. | විධිමත් පරිදි පවරා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කළ යුතුය. | පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| **(ii)** | අමාත්‍යාංශ විසින් භාවිතා කරනු ලබන වෙනත් අමාත්‍යාංශ සතු වාහන 13 ක් පවරා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතී. |